# පැරණි ලංකාවේ නීතිය හා දඬුවම් ක්‍රම පිළිබඳ විමර්ශනයක් (අනුරාධපුර යුගය හා පොළොන්නරු යුගය ආශ්‍රයෙනි)

**ඩබ්ලිව්.එම්. හිරාන් මධුසංඛ**

සමාජීයවිද්‍යා පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය.

hiran6361@gmail.com

ප්‍රමුඛපද: නීතිය, දඬුවම, මිනිසා, යහපත්, අධ්‍යයනය

යහපත්, සාධාරණ හා සදාචාරාත්මක සමාජයක පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය වන්නේ නීතිය බව අවිවාදාත්මක කරුණකි. සරල ව කියන්නේ නම් අයිතිවාසිකම් හා නිදහස සැමට සමාන ව භුක්ති විඳීම සඳහා එය රැක ගන්නා වූ ක්‍රමවේදයක් අවශ්‍ය වේ. එම ක්‍රමවේදය නීතිය ලෙසින් හඳුන්වා දිය හැකි ය. ප්‍රාථමික ජනසමාජයේ දී නීති නොපැවතුන අතර සීමිත වූ අවශ්‍යතා හා උවමනා හමුවේ සාමකාමී පරිසරයක් පැවතිණි. නමුත් කල්යත් ම සමාජය විස්තීර්ණ වීම නිසා සීමිත වූ සම්පත් අසීමිත වූ අවශ්‍යතා මත බෙදී යත් දී මිනිසුන් අතර ගැටුම් ඇති විය. මේ ගැටුම් නිරාකරණයටත් නැවත ගැටුම් ඇතිවීම වළක්වාලීමටත් මිනිසුන් එක් වීසම්මුතියක් තුළින් විශේෂ පුද්ගලයෙකු හට පරමාධිපත්‍ය බලය ලබා දී තම ප්‍රධානියා ලෙස ඔහු පත්කර ගනියි. ඔහු රජු නම් වූ අතර රාජ්‍යය හා මහජනයා පාලනය කිරීමත් ඒ වෙනුවෙන් වූ ධර්මතා පද්ධතියක් නැතහොත් නෛතික තත්ත්ව ක්‍රියාත්මක කිරීමත් ඔහුගේ කාර්ය විය. මුල් කාලීන ව රජුහෝ ප්‍රධානී වූ පුද්ගලයා හෝ සීමිත ආයතනයක් මඟින් මේ නීති හා අධිකරණ කටයුතු සිදු විය. පසු කාලීන ව එම තත්ත්ව විස්තීරණ වීමත් පසු කාලීන ව රජුමෙන් ම ඔහු වෙනුවෙන් පාලනයට එක්වන පිරිස් විසින් මේ නීතිය හා නෛතික කටයුතු විධිමත් ව නිර්මාණය කිරීමත් ඒවා විග්‍රහ කිරීමත් සිදුකරනු ලබයි.

නීතිය හා බද්ධ වන අනෙක් සංකල්පය නම් දඬුවමයි. නීතිය යනු කුමක් ද ඊට පරව සැම විටක ම ඇති සංකල්පය නම් දඬුවමයි. මිනිසා තුළ යහපත් ජීවන රටාවක් ඇති කිරීමට බිහි කළ නීතිය සැම අයෙකුට ම පොදුවන්නා සේ ම උසස්විය යුතු ය. එහි ගෞරවය රැකිය හැක්කේ එය ආරක්ෂා කිරීමෙන් ම පමණකි. එය ආරක්ෂා කිරිමට නම් නීතිය කඩ කිරීමේ දී දඬුවම නම් සංකල්පය අනිවාර්ය වියයුතු ය. ඒ මන්ද නැවතත් එවැන්නක් සිදු වීමට ඇති ඉඩ වළක්වා ලීම සඳහා ය. නීතියේ ස්වභාවය අනුව දඬුවම වෙනස් වන අතර දඬුවමේ මුහුණුවර ද විවිධ විය. දඩ ගැසීම වැනි සුළු දඬුවම්වල සිට

උපරිමය වූ මරණීය දණ්ඩනය දක්වා දඬුවම් හා විධික්‍රම මේ සඳහා අයත් විය. මේ ලෙසින් නීතිය හා දඬුවම් ක්‍රමයන්න පිළිබඳ කෙටි හැඳින්වීමක් සිදු කළ හැකි ය.

නීතිය, නෛතික කටයුතු හා දඬුවම්ක්‍රම පිළිබඳ අධ්‍යයනයේ දී ලංකා ඉතිහාසයේ අනුරාධපුර හා පොළොන්නරු යුගවලට හිමිවන්නේ විශේෂ ස්ථානයකි. ඊට හේතු වශයෙන් සලකන්නේ නම් එම යුග වල දී ශ්‍රේෂ්ඨ කාර්යයන්හි නිරත වූ පාලකයන්ගේ පහළවීම, හා ඔවුන් මෙම නීතිය දඬුවම් හා ඒ හා බැඳුණු සංකල්ප කෙරෙහි දක්වන ලද දායකත්වය හා සම්බන්ධතාව නිසා ය. එසේම මේ කාල වකවානු පුළුල් සමාජ දේශපාලන කාල පරාසයක විහිදී තිබීම හේතුවෙන් ඒ ආශ්‍රිත වූ අවස්ථා සුලබ වීමත් දක්නට ලැබේ. නිදසුන් ලෙස දක්වන්නේ නම් එළාර, වෝහාරිකතිස්ස, මහසෙන්, ගෝඨාභය, සිව් වැනි උදය වැනි රජුන්ගේ දවස ද පොළොන්නරු යුගයේ දී විජයබාහු, පරාක්‍රමබාහු වැනි රජුන්ගේ රාජ්‍ය කාල මේ සඳහා ප්‍රධාන ම මූලාශ්‍රයාගත තොරතුරු දක්වයි. වේවැල්කැටිය සෙල්ලිපිය, බදුලු ටැම් ලිපිය, කොණ්ඩවට්වාන් ලිපිය, පණාකඩුව තඹ සන්නස යනාදී පුරාවිද්‍යා මූලාශ්‍රය මේ සඳහා දක්වන්නේ සෘජු දායකත්වයකි. මේ කාලවල දී මේ හා සම්බන්ධ ව ගොනුකර ගත හැකි කරුණු සුලබ ලෙසින් දැකගත හැකි ය. පාලකයන්ගේ රුචිඅරුචිකම් මත නීති හා දණ්ඩව වෙනස් වූ අවස්ථා ද පාලකයින් විසින් ඒවා කලින්කලට අවස්ථානුරූපී ව වෙනස් කර ගන්නා ලද බවත් මෙහි දී දක්නට ලැබෙන කරුණකි. භාරතීය ආභාෂයෙන් මුල් කාලීන ව නීති මූල සැකසුන ද මේ වනවිට දී දේශීයත්වය පෙරටු කොට ගත් නෛතික පසුබිමක් සැකසුනේ බෞද්ධ දර්ශනයෙන් වූ බලපෑම නිසා බව නොරහසකි. එයම ආශ්‍රයකර ගත් පාලකයෝ කිසි විටෙක දේශීය පාලන යාන්ත්‍රණය නීතිය හා දඬුවම් ක්‍රමවලින් ම්ලේච්ඡත්වය කරාගෙනයාම සිදු කළේ නැත. ලාංකේය ඉතිහාසයේ දක්නට ලැබෙන විශේෂ අවස්ථාවක් ලෙස එය සැලකීම ද අසාධාරණ නොවේ. එ වැන්නකට මග පෑදුනේ බෞද්ධ දර්ශනයෙන් වූ ආලෝකය නිසා ම්ලේච්ඡත්වය පාලනය කිරීමට තිබූ හැකියාව හේතුවෙනි.

එක්සත් රටක් තුළ සාමකාමී පාලනයක් ගෙන යාමේ දී මේ නීති හරියාකාරවම ක්‍රියාත්මක කරනු වස්ප්‍රත්‍යන්ත ප්‍රදේශ කරා ද නෛතික තත්ත්ව විහි දී යන නීති රාමුවක් එකල ඇති කර තිබුණි. මේ වෙනුවෙන් ප්‍රාදේශිය ව වූත් නෛතික වූත් ආයතන අගනුවරට සාපේක්ෂ ව ක්‍රියාත්මක විය. ගම් උසාවි, ප්‍රාදේශිය උසාවි ඒ සඳහා නිදසුන් ලෙස දැක්විය හැකි ය. මේ ආයතනවල බලය සීමාසහිත එකක් වූ බව පැහැදිලි ව පෙනෙන කරුණකි. මධ්‍ය ආණ්ඩුවේ පාලනය එලෙසින් ම ප්‍රත්‍යන්ත දේශ කරා ගෙනයාමට උත්සාහ කිරීම මගින් එක්සත් නීතියක් ක්‍රියාත්මක කිරීම මෙම ප්‍රාදේශීය ආයතන පිහිටුවීමේ ප්‍රධාන අරමුණ විය.

මේ යුගයට අදාළ ව පැරණි ලක්දිව නීතිය හා අධිකරණ දඬුවම් ක්‍රම පිළිබඳ ව අධ්‍යයනය කිරීමේ දී පැහැදිලි ව නිගමනය කළ හැකි එක් කරුණක් වන්නේ එය කිසි විටෙක අමානුෂිය නොවූ බවත් වරදේ ස්වභාවය අනුව හා විවිධ බාහිර සාධක අනුව දඬුවම් නියම වූ බවත් ය.

රාජ්‍යය හා රජුයන උත්තරීතර සංකල්ප කෙරේ බලපෑම් වූ අවස්ථා වල දී දණ්ඩනය අතිශය බරපතල විය. එ පමණක් නොව ඇතැම් අවස්ථාවල දී සමාව දීමත් සිදුවිණි.

මෙම යුගවල දී නීතිය හා නෛතික කටයුතු, දඬුවම් ක්‍රම වල ස්වභාවය හා නෛතික ආයතනවල ක්‍රියාකාරිත්වය කෙසේ වීද යන්න අධ්‍යයනය කිරීම මේ පර්යේෂණයේ අරමුණ වන අතර ඒ පිළිබඳ මූලාශ්‍රය වල පැහැදිලි හා එක්සත් බවක් නොවීම අධ්‍යයන ගැටලුව විය. මේ කාල වකවානුවට අදාළ ව ඇතිමේ මාතෘකාව හා සම්බන්ධවන සිද්ධීන් පිළිබඳ හැදෑරීමයි. පර්යේෂණ ක්‍රමවේදය ලෙසමූලාශ්‍රය අධ්‍යයනය භාවිත වේ.

මූලාශ්‍රය දෙ ආකාර ව භාවිත කරනු ලබන්නේ සාහිත්‍ය මූලාශ්‍ර හා පුරාවිද්‍යා මූලාශ්‍රයන ලෙසිනි. සෙල්ලිපි පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය භාවිතයේ දී ප්‍රධාන වශයෙන් ම අධ්‍යයනයට ලක්වන අතර සාහිත්‍ය මූලාශ්‍රය භාවිතයේ දී මහාවංසය, වංසත්තප්පකාසිනීය හා නිකාය සංග්‍රහය ද තවත් ද්වීතියික මූලාශ්‍රය ද ආධාරකර ගනු ලබයි.